# මේ අයවැය ජවිපෙට ලොකුම අභියෝගයක්

අයවැය ජයග්‍රහනයෙන් ආණ්ඩුවේ අර්බුදය ඉවර වෙන්නේ නෑ. කිරිඇල්ල මන්ත්‍රීතුමා කියන විදියට නම් තුන්වන කියවීමේදී ලොකු එකමුතුවක් ඇති කරගන්නවලු. ඒත් දන් ආණ්ඩුව එක්ක ඉන්න ඡන්ද 18 කඩන එක ලේසියි කියලා කියන්න බෑ. මොකද? යුද්ධය මොන පරිත්‍යාගය හරි කරල ගෙනියන්න ඕන කියන මතය තදින කාවැදිල තියෙනව.

## දේශ හිතෛශී පෙරමුණේ මතය සහ එහි මූලාව

විශේෂයෙන්ම විදේශ ලෝක බලවතුන්ගේ පිහිට ලැබෙන නිසා මොන දුක හරි විඳල හරි මේක කළ යුතුයි කොටින්ගේ බලය බින්දහම ඒ අය සාකච්ඡාවට එනව. මේ මතය ඇතිදැඩි කරල ගොඩනැගුයේ ජනතා විමුක්ති පෙරමුණයි.

විශේෂයෙන්ම විමල් විරවංශ හා ඔහුගේ දේශ හිතෛශී පෙරමුණ. මේ දේශහිතෛශී පෙරමුණත් NGO එකක්. ඒකේ වැඩකොටස තින්දු කරන්නේ ජාතිවාදී කල්ලියක්. පුදුමයට ඒකේ නායකයත් විමල් විරවංශමයි.

දන් මේ මහින්දගේ යුධ ප්‍රතිපත්තිය තදින් ජනතාව අතර ගෙන ගිය ජනතා විමුක්ති පෙරමුණ මෙවර අය-වැයට විරුද්ධව ඡන්දේ දුන්නා. ඔවුන් කියන්නේ අයවැය ගැනම සිතා බලලා මේ තින්දුව ගත් බවයි. ඒක තමයි අපටත් තියෙන ප්‍රශ්නයයි.

මේ අයවැයෙන්, සුභසාධක කපලා, සහන කපලා පඩිනඩි වැඩි කිරීම් නවත්වලා, හැම පැත්තටම බදු දමලා යුද්ධය ගෙන යාමට මුදල් වෙන් කරලා තියෙනව. මේ විදියට යුද්ධය පරිත්‍යාගයෙන් ගෙනියන්න ඕන කියලා නේද මේ ජනතා විමුක්ති පෙරමුණේ නායකයෝ උදේ ඉඳන් හවස් වෙනකල් කියන්නේ. එහෙනම් දන් මොකද්ද ප්‍රශ්නය?

ජනතා විමුක්ති පෙරමුණට මේ මතවාදයේ තියෙන මූලාව දන් තේරිලාද? නැත්නම්, පහළින් එන බලපෑමට යම් ඉඩක් දීම සඳහා මේක රහපෑමක් පමණක්ද?

මොක වුණත් විමල්ලගේ ඔළුවේ මොනවා තිබුණත් මහින්දගේ ධනපති බලය මේක ගැන හිතන්නේ අරියාදුවට කළ දෙයක් හැටියටයි. විශේෂයෙන්ම යුද්ධය ගෙනියනව, ඒ වුණත් දූෂණ වැඩියි, හෙරකම වැඩියි කියලා විවේචනය කළහම ඒක හරියටම බොක්කටම වදින්නේ මහින්ද හා ඔහුගේ කිට්ටු පාලක ජුන්ටා කල්ලියමයි.

ධනපතියන් යුද්ධ කරන්නේ වැඩකරන ජනතාවගේ පරිත්‍යාගයෙන් මිස තමන්ගේ දේපොල විකුණලා නෙවෙයි. ඒ නිසා ධනපතියන්ට තමන්ගේ ගසාකෑම නවත්වලා යුද්ධය ඉදිරියට ගෙනියපල්ලා කියන යෝජනව තමන්ගේම බෙල්ල කැපෙන යෝජනාවක්.

ඇත්ත කථාව නම් වැඩකරන ජනතාවගේ බලයක් මේ වගේ ජාතික මර්ධන යුද්ධයක් ගෙනියන්නේ නෑ. වාමාංශික පක්ෂයක වැඩපිළිවෙල වෙන්නේ පෑගෙන ජාතියට ස්වයංතීරණය නැත්නම් ස්ව පාලනය ප්‍රදානය කරමින් යුද්ධය නවත්වා සාමය ඇති කිරීමයි.

දුප්පත් ජනතාවගේ කරපිට නැගලා සිංහල ජාතිවාදය ගෙන යන ජනතා විමුක්ති පෙරමුණේ ලොකුම අභියෝගය මතුවෙලා තියෙන්නේ දනුයි.

ආණ්ඩුවේ ඉන්න පැරණි වාමාංශික නායකයෝ හැටියට පෙනී සිටින තිස්ස, ඩීව් වගේ උදවිය ඇත්තටම මහින්දගේ හිරකාරයෝ විතරයි. මේ ආණ්ඩුව රැකගෙන ආණ්ඩුවට වෙලා කරන්නේ මොන ඉටි ගෙඩියද කියලා ඇහැව්වහම කියන්න දෙයක් නෑ. මේ රජය බහුජාතික සමාගම් තන්ත්‍රයේ වහල් කොන්දේසි අනුව නටන, ඒ අයගේ න්‍යාය පත්‍රය දියත් කරන, යැංකි මංකි බලවතුන්ගේ දාසයෙක් හැටියට වැඩ කරන බව ඔවුන් හොඳටම දන්නවා. කිසිම ප්‍රජාතන්ත්‍රවාදී නිදහස් ක්‍රියාමාර්ගයක් මේ රජයට ගන්න බෑ. ගන්නෙත් නෑ. එහෙව් එකේ එම රජයේ මුක්කුවක් ලෙස ඇමතිකම් අතගගා ඉන්නේ මොන උවමනාව වෙනුවෙන්ද?

කාටද මේ දාසයෝ සේවයක් ඉෂ්ඨ කරන්නේ?

## රනිල්ගේ වැඩපිළිවෙල

මේ අයවැය නිසා ඇති වන එක හොඳක් තමයි රනිල්ගේ විරුද්ධවාදී වැඩපිළිවෙල බංකොළොත් කියලා ජනතාවට පේන එක. රනිල්ට තවම තිබෙන්නේ "රිගේනින් ශ්‍රී ලංකා" වැඩපිළිවෙලමයි. ලෝක බැංකුව ඇතුළු ලෝක බලවතුන් සමඟ ගෙනියන මේ වැඩපිළිවෙලමයි. ඇත්තටම දන් මහින්ද ක්‍රියාත්මක කරන්නේ රනිල් හදලා සැලසුම් කරපු මහාපරිමාණ වැඩසැලැස්මමයි. පොඩ්ඩක් එහාමෙහා කළත් යන්නේ ඒ ක්‍රියාමාර්ගයමයි.

රනිල් නෑ කියලා කියනවද? නෑ, එහෙම කියන්නේ නෑ. දූෂණ වැඩියි කියන එක විතරයි කියන්නේ. ඒත් එයා අගමැති කාලේ තමා කෝප් වාර්තාවේ සඳහන් වන දූෂණ සියල්ල සිද්ධ වුණේ. එතකොට මොකද්ද ජනතාවට මේ දෙන්නගෙන් තෝරාගන්න තිබෙන්නේ?

පහුගිය කාලේ රනිල් තදින්ම යුද්ධය වෙනුවට සාමය හා පෙඩරල් විසඳුම් ගැන කථා කළා. දන් ඒකත් නෑ. කියන්නේ යුද්ධය හොඳට කරන්නේ නෑ කියලා. මිනිස්සුන්ට මේවා අහලා මොන විලම්භිතයක්ද මේ කියලා හිතෙන එක පුදුමයක්ද?

## චම්පික රණවක

දැන් පාර්ලිමේන්තුවේ නියම බලකාරයා යුධවාදී ඊනියා සිංහල බෞද්ධ රාජ්‍යවාදී චම්පික රණවකයි. ජනතා විමුක්ති පෙරමුණත් එම කඳවුරට මොහොතකට හරි විරුද්ධ වෙද්දී වැටෙන කඩොල් ඇතා හොම්බෙන් අල්ලා නැගිට්ටවූ නන්දිමත්‍රයා වගේ චම්පික මහින්ද රජය කෙළින් කළා. ඔහුගේ මතයෙන් සංඝ සභයත් අරන් දුන්නා. ජනතාවට කරපු මේ වින්නැහියට මෙයාට යන්න වෙනම අපායක් හදන්න වෙනවා.

ඒත් මේ මොහොතේ නියම බලකාරයා චම්පික කියලයි මට නම් පෙනෙන්නේ. ජනතා විමුක්ති පෙරමුණ ජනතාව දෙසට පය ගහපු නිසා මර්ධනකාරී රාජ්‍ය තුළ චම්පිකට දැන් කිසිම අභියෝගයක් නෑ,

කොහොමටත් මිනිහ මතවාදීව මහින්දව අල්ල ගෙන ඉන්න බව කලක ඉඳන්ම කරන කියන දේවල්වලින් ජනතාවට වැටහුනා. දැන් නම් ඒක හොඳටම එළිදරව් වුණා.

දැන් ඉතින් චම්පිකලාගේ අවනීතිය නීතිය බවට පත්වෙන යුගය ඇවිදින්. යුද්ධය වෙනුවෙන් ඕනෑම පියවරක් ගැනීමට පාර්ලිමේන්තු බලයක් ලැබුණ බව ඔවුන් කියාවි.

ඒ අනුව විවිධ සහන කපන අතරම බර පැටවීම වැඩි කරයි.

බජට් එක දේශපාලන ලියැවිල්ලක් ලෙසට ඉදිරිපත් වුණ නිසා එහි ජයග්‍රහනය දේශපාලන ජයග්‍රහනයක් හැටියට පෙන්වන එක වලක්වන්න බෑ.

ඒ දේශපාලනය තමා තමා සියළු වියදම් කරලා සියළු පරිත්‍යාග කරලා ජාතිවාදී මර්ධන රජයක් ගොඩනැගීම.